"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු."
ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

"ශ්‍රාවස්ති මන්දිරය", 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
"சிராவஸ்தி" கட்டடம் ,32, ஸ்ரீமத் மார்கஸ் பர்ணாந்து மாவத்தை, கொழும்பு 07.
"Sravasthi Mandiraya", 32, Sir Marcus Fernando Mawatha, Colombo 07.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 2698409
ෆැක්ස් / பெக்ஸ் / Fax - 2694667
ඊ-මේල් / ஈ-மெயில் / Email chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி / General Telephone 2682868, 2682869, 2682870

මගේ අංකය / எனது இல. / My No. CSO/FIN/2/3/2(111)
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date. 2018.01. 25

## බස්නාහිර පළාත්

## ව්‍යාපාර චක්‍රලේඛ අංක 02/2018

බස්නාහිර පළාතේ,
සියළුම ලේකම්වරුන්,
පළාත් සභා අධිකාරි/ව්‍යවස්ථාපිත ආයතන වල
සභාපතිවරුන් වෙත.

### පළාත් සභා අධිකාරි/ව්‍යවස්ථාපිත ආයතනවල ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් සඳහා වෘත්තීය දීමනාවක් ලබා දීම.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2017.10.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2017 හි දැක්වෙන උපදෙස් සැලකිල්ලට ගෙන පළාත් සභා අධිකාරි/ව්‍යවස්ථාපිත ආයතනවල ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් සඳහා 2017.10.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වෘත්තීය දීමනාවක් ගෙවීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත.

01. ගෙවිය යුතු මාසික වෘත්තීය දීමනාව.

| කාණ්ඩය | මාසික දීමනාව (රු.) |
|---|---|
| වසර 06කට අඩු සක්‍රීය සේවා කාලයක් සහිත නිලධරයන් | 3,000.00 |
| වසර 06ක් හෝ එයට වැඩි සහ වසර 11ට අඩු සක්‍රීය සේවා කාලයක් සහිත නිලධරයන් | 5,000.00 |
| වසර 11ක් හෝ එයට වැඩි සහ වසර 19ට අඩු සක්‍රීය සේවා කාලයක් සහිත නිලධරයන් | 10,000.00 |
| වසර 19ක් හෝ එයට වැඩි සක්‍රීය සේවා කාලයක් සහිත නිලධරයන් | 15,000.00 |

02. ඉහත දීමනාව ගෙවීමට අදාල කොන්දේසි.

I. මෙම දීමනාව කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 හි උපලේඛණ 111 හි දැක්වෙන සේවක වර්ගීකරණයෙහි ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත්වන තනතුරු සඳහා පමණක් අදාල කර ගත යුතුය.

II. මෙම දීමනාව ගෙවිය යුත්තේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 යටතේ වැටුප් ගෙවනු ලබන ආයතනවල අදාල කාර්ය මණ්ඩලය සඳහා පමණි.

III. මෙම දීමනාව සඳහා හිමිකම් ලබනුයේ ඉහත චක්‍රලේඛයේ සඳහන් අයුරින් දැනට ලබන වැටුපට අතිරේකව ගෙවනු ලබන ගැලපුම් දිමනාව සහ ජීවන වියදම් දීමනාවට අමතරව භාෂා ප්‍රවීණතා දීමනා, ප්‍රවාහන දීමනා, අවධානම් දීමනා සහ දුරකතන දීමනා හැර වෙනත් කිසිදු විශේෂ දීමනාවක් නොලබන නිලධාරීන් සඳහා පමණි.

IV. ජ්‍යෙෂ්ඨ මට්ටමේ සේවා කාලය ගණනය කිරීමේදී, නිලධාරියෙකු එම ආයතනයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක සේවය කල සක්‍රීය සේවා කාලය පමණක් අදාල කර ගත යුතුය.

03. 2011.12.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 28/2011 හි සඳහන් දීමනාව හිමි නිලධාරීන් හැර අනිකුත් නිලධාරීන් සඳහා මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අදාල වේ.

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්, පළාත් මුදල්
අමාත්‍යාංශ ලේකම් .
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත්: i. ආණ්ඩුකාර ලේකම් (බ.ප.)
ii. විගණකාධිපති.
iii. සියළු නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් (බ.ප.)
iv. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) (බ.ප.)
v. තොරතුරු තාක්ෂණ නිලධාරී